**UNIVERSITY OF PERADENIYA**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (බාහිර - නව නිර්දේශය) 200 මට්ටම - 2020 පෙබරවාරි - අප්‍රේල්**
**Bachelor of Arts (External - New Syllabus) Examination 200 Level –From February to April 2020**

SINE 201 – සාහිත්‍ය න්‍යාය සහ සාහිත්‍ය විචාරය

කාලය පැය **(03)** තුනයි.

එක් කොටසකින් ප්‍රශ්න දෙක (02) බැගින් වත් තෝරාගෙන ප්‍රශ්න **පහකට (05)** පිළිතුරු සපයන්න.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව අටකි (08).

---

## I කොටස

(1) 'අලංකාර'ශබ්දය විවිධ නයින් නිර්වචනය කොට "කාව්‍ය ශරීරයට කාව්‍යත්වය ආරෝපණය කරන්නේ අලංකාරයි" යන ප්‍රකාශය විවරණය කරන්න.

(2) රස සූත්‍රය විග්‍රහ කොට 'ස්ථායිභාව' රස බවට පත් වන ආකාරය නිදර්ශනාත්මක ව සාකච්ඡා කරන්න.

(3) "අනෞචිත්‍යය රස විනාශ කරන හෙයින් රසෝත්පාදනයෙහි ලා වෙහෙසෙන්නවුන් නිර්මාණයේ ඖචිත්‍යය සුරැකිය යුතුයි." ඉහත කී ප්‍රකාශය සනිදර්ශන ව සාකච්ඡා කරන්න.

(4) 'ධ්වනිය කාව්‍යයේ ආත්මය" යැයි ධ්වනිවාදීන් පැවසුවේ කවර නිසාදැයි පහදන්න.

## II කොටස

(5) නූතනවාදය (Modernism) පිළිබඳ විවරණයක් කොට සිංහල පද්‍යයේ දක්නට ලැබෙන නූතනවාදී ප්‍රවණතා නිදසුන් සහිත ව සාකච්ඡා කරන්න.

(6) "මායා යථාර්ථවාදී (Magical Realism) නිර්මාණකරුවෝ යථාර්ථය ගැඹුරින් දනවීමට මායාරූපී සිද්ධි බහුල ව භාවිතයට පෙලඹී සිටිති." ඉහත කී ප්‍රකාශයට පක්ෂ ව හෝ විපක්ෂ ව කරුණු දක්වන්න.

(7) නිර්මාණකරුවන් නව අර්ථ/නව මාන දනවීමට පුරාණෝක්ති භාවිත කරන ආකාරය පුරාණෝක්ති විචාරය (Archetypal Criticism) විස්තර කරමින් පැහැදිලි කරන්න.

(8) 'විසංයෝජනවාදය (Deconstruction) යනු කියවීම, ලිවීම සහ අර්ථ කථනය පිළිබඳ නීති රීති ඇතුළත් විචාර සිද්ධාන්තයකි." සාකච්ඡා කරන්න.

(සැම ප්‍රශ්නයකට ම ලකුණු 15 බැගිනි.)